# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ
# ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ

## ගිනි නිවීම් ඒකකයේ ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව තුළ දැනට පුරප්පාඩුව පවතින ගිනිහට තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු නාමය - ගිනිහට**

(තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතයි)

**02. වැටුප් පරිමාණය සහ වැටුප් කේත අංකය**

**වැටුප් පරිමාණය** - රු. 49550 - 7X540 -27 X670-71420/-

**වැටුප් කේත අංකය** - RS 1-2025

**03. පුරප්පාඩු සංඛ්‍යාව** - 24

**04. අධ්‍යාපන සුදුසුකම්** - එකවරකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර, එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන්ද සමත්ව තිබිය යුතුය.

**05. කායික සුදුසුකම්**

i. උස සෙ.මී.162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය.
(ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය)

ii. සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් , තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතරද , වර්ණ පෙනීමද සාමාන්‍ය විය යුතුය.

iv. කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

**06. වෙනත්**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

iii. අවිවාහක පිරිමි අයෙකු විය යුතුයි.

iv. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධි ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කළ යුතුය.

v. තනතුරට බඳවා ගැනීම සඳහා නියමකර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07. වයස**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 24 නොවැඩි විය යුතුයි.

**08. බඳවා ගැනීමේ ක්‍රමය**

i. මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ප්‍රථමයෙන් ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලබන අතර එම පරීක්ෂණයෙන් සමත්වන්නන් සඳහා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

ii. ලිඛිත පරීක්ෂණය සහ වෘත්තීය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිහටයින් වශයෙන් අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර ඔවුන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතුවේ.

**09. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

ගිනිහට තනතුරට බඳවා ගැනීම සම්බන්ධ අනෙකුත් සියලුම තොරතුරු සහ කොන්දේසි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ වෙබ් අඩවියේ (kotte.mc.gov.lk) දැක්වෙන අතර එහි සඳහන් ආකෘතිය අනුව අයදුම්පතක් පිළියෙල කර 2026.09.01 වන දින හෝ එදිනට ලැබෙන සේ "**නාගරික කොමසාරිස්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව, අංක 06, නාවල පාර, රාජගිරිය**" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉදිරිපස ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුවේ. නියමිත දිනට පසුව ලැබෙන සහ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**නාගරික කොමසාරිස්,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.**